# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/78/2025 (PSC)**

ජී.ඒ.ඩී.ජී.අල්විස්

**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.06.04**

**ඉදිරියේ දී** **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**
**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**
**එස්.නන්දසේකරන් (සාමාජික)**

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක එම්.කරපුටුගල මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ආර්.ඩබ්.ඩී.චතුරිකා මහත්මිය.

**-<u>නියෝගය</u>-**

අභියාචක ජී.ඒ.දිනුක ගයාන් අල්විස් යන අය විසින් තැපැල් මඟින් එවන ලද 2025.03.25 දාතමින් යුත්, නමුත් 2025.04.02 දින මෙම විනිශ්චය අධිකාරය වෙත ලැබුණ අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත ඉදිරිපත් කර තිබූ චෝදනාවන්ගෙන් නිදහස් කර ඒ අනුව පනවන ලද විනය දඬුවම ඉවත් කර දෙන ලෙසයි. 2022.10.30 දිනැති චෝදනා පත්‍රය, අභියාචක වෙත බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුක්තව නිකුත් කර ඇත. එකී චෝදනා පත්‍රය මඟින් චෝදනා තුනක් ඉදිරිපත් කර තිබූ අතර, ඒවා අතුරින් තුන්වන චෝදනාවෙන් අභියාචක නිදොස් කොට නිදහස් කර ඇත. ඔහුව වරදකරු බවට පත් කර ඇත්තේ, ප්‍රථම චෝදනා දෙකට පමණි. එම චෝදනා දෙක පහත දැක්වේ.

1. 2022.05.22 දින පොළොන්නරුව බන්ධනාගාරයට දර රැගෙන ලොරි රථයක් පෙ.ව.10.30ට පමණ පැමිණ ඇති අතර, ඒ අවස්ථාවේ ඉදිරිපස ප්‍රධාන දොරටුවේ කාර්යභාර නිලධාරියා ලෙස රාජකාරී කල ආර්.එම්.පුන්චිබණ්ඩා (බන්ධනාගාර සැරයන්) මයා විසින් ඒ බව එම්.යූ.කරුණාරත්න (බන්ධනාගාර සැරයන්) මහතාට දැනුම් දී ඇති අතර අභියාචක ජී.ඒ.ඩී.ජී.අල්විස් මහතාව (ජේලර් II) දර බෑමේ හා දරවල බර කිරීමේ අධීක්ෂණ නිලධාරියා ලෙස පත් කර ඇත.

2. එම අවස්ථාවේදී අභියාචක විසින් එම්.යූ.කරුණාරත්න මහතාට දර බෑම සඳහා සිරකරුවන් කිහිප දෙනෙකු රැගෙන එන ලෙස දන්වා ඇත. දර බාන අවස්ථාවේදී ඉදිරිපස දොරටුව විවරව තබා ඇති අතර, ඉන් බන්ධනාගාර සිරකරු යූ.ජී.සුරංග ප්‍රදීප් කරුණාරත්න මයා පැන ගොස් ප්‍රධාන මාර්ගයේ දිව ගොස් ඇත. එම සිදුවීම වන විටම එම ස්ථානයට පැමිණි කාර්යභාර නිලධාරි කේ.ලෝගීදාසන් මහතා (බන්ධනාගාර නියාමක) විසින් සිරකරු පැනයන අයුරු දැක කෑ ගසා ඇත. එවිටම අභියාචක සහ අනෙකුත් බන්ධනාගාර නිලධාරීන් අභියාචක පසු පස දිව ගියද ඔහුව අල්ලා ගැනීමට නොහැකි වී ඇති අතර පසුව සිදු කල සෝදිසි කිරීමකදී එදින රාත්‍රී 11.45ට පමණ පැනගිය සිරකරු සොයාගෙන බන්ධනාගාරයට රැගෙනවිත් ඇත.

ඉහත චෝදනා දෙක ඉදිරිපත් කිරීම සඳහා පදනම් කර ගෙන ඇත්තේ, යූ.ජී.සුරංග ප්‍රදීප් කරුණාතිලක නමැති සිරකරුව අභියාචකගේ නොසැලකිල්ල හේතුවෙන් නීත්‍යානුකූලව අත්අඩංගුවෙන් පැන යාමට ඉඩ සැලැස්වීමෙන් හෝ පැන යාමට ඉඩ ප්‍රස්ථාව ලබා දීමෙන්, අභියාචක රාජකාරිය පැහැරහැර තිබේද යන කරුණයි.එසේ නම් මෙහිදී සළකා බැලිය යුතු වන්නේ, ඉහත කී සිරකරු අත්අඩංගුවෙන් පැන යාම සම්බන්ධයෙන් අභියාචක වරදකරු බවට පත් කිරීමට ගෙන ඇති තීරණයෙහි ඇති නිරවද්‍යතාවයයි.

ඉදිරිපත් කර ඇති සාක්ෂි සළකා බැලීමේදී පෙනී යන්නේ, පැන ගිය සිරකරුට පවරන ලද කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා අභියාචක වෙත නියම

කර තිබූ බවයි. බන්ධනාගාරය වෙත රැගෙන එන ලද, දර භාර ගැනීම සහ ඒවා බෑමේ කටයුතුවල යෙදවීම පැන ගිය සිරකරුට නියමව තිබූ කාර්යයන් බව අවිවාදයෙන් පිළිගෙන ඇත. එම ක්‍රියාවලියේදී සිරකරු පැන ගිය බවද පිළිගැනුනු කරුණකි. එසේ නම් මෙහිදී තීරණය කළ යුතු වන්නේ, සිරකරුගේ පැන යාමට අභියාචක කොතරම් දුරට වගකිව යුතුද යන්නයි.

අභියාචක වෙත නඟා ඇති චෝදනාව වන්නේ, සිරකරු පැන යන අවස්ථාවේ, ඉදිරිපස යකඩ දොර විවෘතව තැබීම; සහ පැන යන සිරකරුට වෙඩි තැබීමට හෝ අවම වශයෙන් අහසට වෙඩි තැබීමට ක්‍රියාකරමින් සිරකරු මෙල්ල කිරීමට ක්‍රියානොකිරීම; සහ රාජකාරී නළාව නාද කරමින් රාජකාරියේ යෙදී සිටි නිළධාරීන් කැඳවා ගැනීමට ක්‍රියා නොකිරීමයි. එම අවස්ථාවේදී ඉදිරිපස යකඩ දොර විවෘතව තිබීම සහ  සිරකරුට හෝ අහසට වෙඩි තබා නොතිබීම හෝ රාජකාරි නළාව නාද නොකිරීම යන කරුණුද, විවාදයට භාජනය වී නැත. එසේ නම් එම රාජකාරිය සම්පූර්ණ කිරීම සඳහා අභියාචකට වගකීමක් පැවරී තිබුණේද යන්න සාක්ෂි වලින් සනාථ වී තිබිය යුතුය.

විධිමත් විනය පරීක්ෂණයේදී පැ4 ලෙස සළකුණු කරන ලද ලේඛනය අනුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් විසින් අභියාචක වෙත දර භාර ගැනීමේ අධීක්ෂණ කටයුතු පවරා ඇති බව පැහැදිළිව සනාථ වී ඇත. එම ලේඛනය සැරයන් මංජුල කරුණාරත්න විසින් අභියාචක වෙත දැනුම් දුන් බව අභියාචක විසින්ම ලබා දී ඇති සාක්ෂියෙහි සඳහන් වේ.  ඒ සඳහා 2024.03.02දින සටහන්වල II වන පිටුවේ I ඡේදයේ අවසාන කොටස බලන්න. (නඩු සටහන්හි 54 පිටුව) ඉහත කී තත්වය අභියාචක විසින්ම පිළිගෙන ඇති නිසා, මෙම සම්පූර්ණ ක්‍රියාවලියෙහි ප්‍රධාන වගකීම අභියාචක වෙත රාජකාරිමය වශයෙන් පවරා තිබූ බව හොඳින්ම පැහැදිලි වේ. එසේ නම් දර භාර ගැනීම සහ දර බෑම යන ක්‍රියාවලියෙහි සම්පූර්ණ අධීක්ෂණය අභියාචක වෙත පවතී. එවැනි තත්ත්වයක් යටතේ, සිරකරුවකු හදිසියෙන් පැන යා හැකිය යන මතයේ පිහිටා, ඒ සඳහා අවශ්‍ය සියළුම පෙර සූදානම් අභියාචක විසින් රැගෙන තිබිය යුතුය.

අනෙක් අතට සඳහන් කරන්නේ නම්, එකී  පෙරසූදානම් නිසි ආකාරයෙන් ගෙන තිබුනේ නම්, සිරකරුට පැන යාමට හැකි වන්නේ නැත.

එසේ නම් ඒ මතම අභියාචක ඔහුගේ රාජකාරිය පැහැර හැර ඇති බව මනාව ඔප්පු වේ.

ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/